# ජනමාධ්‍ය අමාත්‍යාංශය
# ஊடக அமைச்சு
# MINISTRY OF MASS MEDIA

163, ඇසිදිසි මැදුර, කිරුලපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05
163, அசிதிசி மெதுர, கிருளப்பனை மாவத்தை, பொல்ஹேன்கொடை, கொழும்பு - 05
163, Asidisi Medura, Kirulapone Mawatha, Polhengoda, Colombo 05


මගේ අංකය / எனது இல. / My No. MM/RTI/Rti day/2019/1 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2019.09.24

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,

සියලුම පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්/දිසාපතිවරුන්,

සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්

සියලුම සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්,

සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්

**2019 සැප්තැම්බර් 15 සිට ඔක්තෝම්බර් 15 දක්වා තොරතුරු මාසය ප්‍රකාශයට පත්කිරීම සහ සැමරීම.**

තොරතුරු දැනගැනීමේ අයිතිය ලොව පුරා ක්‍රියාත්මක වීමත් සමග යුනෙස්කෝ සංවිධානය 2015 නොවැම්බර් 17 වන දින සම්මත කරන ලද 38 C/ 70 යෝජනාව මගින් සෑම වසරකම සැප්තැම්බර් 28 වන දින තොරතුරු සඳහා විශ්ව ප්‍රවේශය පිළිබඳ ජාත්‍යන්තර දිනය ලෙස ප්‍රකාශයට පත් කරන ලදී.

2. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 14 අ. මගින් තොරතුරු සඳහා ප්‍රවේශවීමේ අයිතිය පුරවැසියන්ගේ මූලික අයිතිවාසිකමක් බවට නීතිගත කර ඇත. එකී අයිතිය බලාත්මක කිරීම උදෙසා 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත 2016 අගෝස්තු මස 04 දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සම්මත කරන ලද අතර, තොරතුරු පනතේ 2 වන වගන්තිය ප්‍රකාරව මෙම පනතේ විධිවිධාන සක්‍රිය ලෙස බලාත්මක වීම සහතික කිරීම ජනමාධ්‍ය අමාත්‍යවරයාගේ වගකීම වේ.

3. ඒ අනුව මෙවර සැප්තැම්බර් 28 දිනට යෙදෙන ජාත්‍යන්තර තොරතුරු අයිතිවාසිකම් දිනය වෙනුවෙන් සැප්තැම්බර් 15 දින සිට ඔක්තෝම්බර් 15 දින දක්වා කාලය තොරතුරු මාසයක් ලෙස ප්‍රකාශයට පත්කිරීමට ජනමාධ්‍ය අමාත්‍යාංශය පියවර ගෙන ඇත. මෙම තොරතුරු මාසය තුළ පුරවැසියන් දැනුවත් කිරීමේ වැඩසටහන් ඇතුළු තොරතුරු පනතට අදාල ක්‍රියාකාරකම් රැසක් සිදු කිරීමට නියමිත අතර, 2019 .09.17 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් ඒ සඳහා අනුමැතිය හිමිව තිබේ.

4. එබැවින්, පහත සඳහන් කරුණු පිළිබඳව අවධානය යොමු කරමින් තොරතුරු මාසය තුළ (සැප්15-ඔක් 15) තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම සැමරීම වෙනුවෙන් ඔබ ආයතනයේ සහ අනුබද්ධ ආයතනයන්හී වැඩසටහන් සංවිධානය කොට ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

( අ ) තොරතුරු මාසයේ පහසු දිනයක ආයතන ප්‍රධානියා හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් තොරතුරු සඳහා ප්‍රවේශ වීම පුරවැසි මූලික අයිතිවාසිකමක් බව, තොරතුරු දැනගැනීමේ පනතේ වැදගත්කම,තොරතුරු ඉල්ලීමකට ප්‍රතිචාර දැක්වීමේදී සැලකිලිමත් විය යුතු කරුණු , ප්‍රගාමීව තොරතුරු ප්‍රකාශයට පත්කිරීම හා පනත අනුව තොරතුරු ආරක්ෂාකර ගැනීමේ රෙගුලාසි සහ වගකීම් යනාදී කාරණා පිළිබඳව දැනුවත් කරමින් විනාඩි 20 ක පමණ කෙටි දේශනයක් පැවැත්වීම.

(ආ) ජනමාධ්‍ය අමාත්‍යාංශය මගින් දිවයින පුරා සංවිධානය කරනු ලබන වැඩසටහන් සඳහා අමාත්‍යාංශයේ ඉල්ලීම් පරිදි අවශ්‍ය සක්‍රිය සහයෝගය ලබා දීම.

(ඇ) තොරතුරු මාසය තුළ ආයතනය වෙත පැමිණෙන පුරවැසියන් දැනුවත් කිරීමේ ක්‍රමවේද හඳුනා ගනිමින් ක්‍රියාත්මක කිරීම.

(ඇ) ආයතනයේ තොරතුරු නිලධාරියා හා නම්කල නිලධාරියාගේ විස්තර සඳහන් කරන ලද නාම පුවරු (පනතේ 26 (1) අනුව) ආයතන පරිශ්‍රයේ මහජනතාවට මනාව දර්ශනය වන ස්ථානයක ස්ථාපිත කිරීමටත්, ආයතනයේ සහ අනුබද්ධ ආයතනවල වෙබ් අඩවිවල ප්‍රගාමී තොරතුරු යාවත්කාලීනව ප්‍රකාශයට පත්කිරීමටත් , පනතේ 8 සහ 10 වන වගන්තීන්හී සඳහන් වාර්තා ආදිය ඉදිරිපත් කිරීමට පොදු අධිකාරිය සතු කාර්යභාරය නිසි ලෙස ඉටු කිරීමටත් කටයුතු කිරීම.

**5.** මෙම කාර්යය සාර්ථක කරගැනීමට ඔබ දක්වන සහයෝගය මා ඉතාම අගය කොට සලකමි.

**සුනිල් සමරවීර**
ලේකම්
ජනමාධ්‍ය අමාත්‍යාංශය

පිටපත්- 01. **ජනාධිපති ලේකම්**,ජනාධිපති ලේකම් කාර්යාලය **(කරු.දැ.ගැ.ස)**

**02. ලේකම්,** අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය **(කරු.දැ.ගැ.ස)**

**03. ලේකම්,** රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය. **(කරු.දැ.ගැ.ස)**